# ජාතික
# මානව හිමිකම් කොමිෂන් සභාව
# ගැන දැන ගනිමු



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව ගැන දැන ගනිමු

ISBN 978-955-8929-17-9

ප්‍රථම මුද්‍රණය : 2014

උපදේශකත්වය : නීතිඥ නිමල් පී පුංචිහේවා
නීතිඥ සමන්ති ජයමාන්න පරණගම

සංස්කරණය : නීතිඥ මේනකා හේරත්
නීතිඥ කේ. කපිලන් විල්ලවරාජන්

කවර නිර්මාණය
පිටුසැකසුම සහ මුද්‍රණය : විකුම් ග්‍රැෆික්ස්, නො 33, මායා මාවත,
පතිරගොඩ, මහරගම.

ප්‍රකාශනය : ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
අංක 165, කින්සි පාර, කොළඹ 08.

ISBN 978-955-8929-17-9
9 789558 929179

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහජන ව්‍යාපෘතියකි

## 01.0 හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගත් පැරිස් මූලධර්මයන්ට අනුකූලව ශ්‍රී ලංකා රජය (State) විසින් 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ ස්වාධීන ජාතික ආයතනය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවනු ලැබ ඇත.

මෙම පනත යටතේ රටතුල මානව හිමිකම් අධීක්ෂණය, ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම හා උපදෙස් දීම සඳහා කොමිෂන් සභාවට පුළුල් බලතල හිමිවී ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේදී හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණයට අමතරව සෑම තරාතිරමකම පුද්ගලයකුටම සහන ලබා ගැනීම සඳහා යොමු විය හැකි  ජාතික ආයතන වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රටතුල මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් අධීක්ෂණය කර එයට අදාළව පවතින නීති, ප්‍රතිපත්ති රෙගුලාසි, පරිපාටි තත්ත්වයන් සොයා බලා මානව හිමිකම් ප්‍රමිතීන් තහවුරු කිරීම උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි.  තවද ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සකස් විය යුතු ආකාරය පිළිබඳව රජයට අවශ්‍ය උපදෙස් ලබාදීමේ කාර්යයේදී රජය විසින් එකඟ වනු ලබන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම හා පොදු ජනතාව සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට මානව හිමිකම් අධ්‍යාපනය ලබාදීමද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාත්‍යන්තර මානව හිමිකම් තත්ත්වයන් සහ නියමයන් රටතුල තහවුරු කිරීමට කටයුතු කරන අතර රජය සහ සිවිල් සංවිධාන සම්බන්ධීකරණය කරන පාලමක් ලෙසටද ක්‍රියා කරනු ලබයි.  එසේම මානව හිමිකම් ආරක්ෂයින්ගේ ආරක්ෂකයා ලෙසටද කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකාව තුල මානව හිමිකම් සංස්කෘතියක් ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ගැනෙන උත්සාහයන්වල එක් පියවරක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ කරුණු ඇතුළත්ව මෙම කුඩා ග්‍රන්ථය සකස් කරනු ලැබීය,  එමගින් මහජනතාවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ වැඩිදුරටත් අවබෝධයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.

## 2.0 ජාතික මානව හිමිකම් ආයතනයන්හි ස්ථාපනය

පාර්ලිමේන්තුවට හා රජයට මානව හිමිකම් ක්ෂේත්‍රයේ අවශ්‍ය උපදෙස් ලබාදීමේදී ජාතික මට්ටමේ ආයතනය ලෙස ජාතික මානව හිමිකම් ආයතනය හැඳින්විය හැකිය. මෙකී ආයතනය විසින් මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් රටතුල තහවුරු කිරීමට කටයුතු කරයි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ජාතික මානව හිමිකම් ආයතන වලට අදාලව පැරිස් මූලධර්ම 1994 දී යෝජනා 48/134 යටතේ හඳුන්වා දෙනු ලැබිය.

මෙම පැරිස් මූලධර්මය අනුව ජාතික ආයතන වලට මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීමට පුළුල් විෂය පථයක් ලබා දෙනු ලැබීය. මෙහි වැදගත්ම කරුණ වූයේ මෙම විෂය පථය තුල රජයට පාර්ලිමේන්තුවට මෙන්ම අනෙකුත් බලයලත් ආයතන වලට උපදෙස් ලබා දීමේ හැකියාවක් සහිත ආයතනයක් බවට ජාතික මානව හිමිකම් ආයතනය පත්කරනු ලැබීමය. රටතුල මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම රටේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ වාර්තා සකස් කිරීම හා මානව හිමිකම් අධ්‍යාපනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පැරිස් මූලධර්මයන්ට අන්තර්ගතය.

පැරිස් මූලධර්ම මෙහිදී අවධාරණය කරනු ලබන ඉතා වැදගත්ම කරුණ වන්නේ ජාතික මානව හිමිකම් ආයතනය අනිවාර්යයෙන්ම හා සත්‍ය වශයෙන් රජයෙන් ස්වාධීන විය යුතු බවයි. මෙම ස්වාධීනත්වය රාජ්‍යයන් විසින් පෙන්නුම් කරනු ලැබිය යුත්තේ අදාළ ආයතන සඳහා සිදු කරනු ලබන නිලධාරීන් පත් කිරීමේදී හා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සැලසීමේදීය.

පසුගිය දශක දෙක පුරා ජාතික මානව හිමිකම් ආයතන ලොව පුරා විවිධ රට වල පිහිටවනු ලැබිය. මෙම ආයතන විවිධ නම් වලින් හඳුන්වනු ලැබුවද මේ සැම ආයතනයකම පොදු ගුණාංගය වන්නේ තම රටවල ආණ්ඩුවලින් ස්වාධිනව ක්‍රියාත්මක වීමය. මෙම ජාතික මානව හිමිකම් ආයතන මානව හිමිකම් ප්‍රවර්ධනයට හා ආරක්ෂා කිරීමට පවතින ජාත්‍යන්තර පද්ධතීන් සමඟ සම්බන්ධිතය. ජාතික මානව හිමිකම් ආයතන වල අරමුණ විය යුත්තේ තම රටතුල මානව හිමිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමය.

එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලය විසින් 64/1613 ලෙස 2010 දි සම්මත කරගනු ලැබු යෝජනාවක් මඟින් පැරිස් මුලධර්ම මත පදනම්ව ශක්තිමත් කරගනු ලැබු මානව හිමිකම් දේශිය මට්ටමින් ක්‍රියාත්මක කිරිමක් පමණක් නොව දේශිය මට්ටමින් නීතියේ ආධිපත්‍ය හා යහපාලනය පිළිබඳව මුලධර්මයන් ශක්තිමත් කිරිමේ වගකිමද ජාතික මානව හිමිකම් ආයතනයට ලබා දෙනු ලැබිය.

ජාතික මානව හිමිකම් ආයතනය පිළිබඳව ජාත්‍යන්තර සහයෝගිතා කමිටුව විසින් (ICC) විසින් පාර්ශවකාර රාජ්‍යයන් පැරිස් මූලධර්ම අනුගමනය කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ජාතික මානව හිමිකම් ආයතනය ලෙස හඳුන්වනු ලබන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවයි.

## 3.0 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීමට පෙර පැවති මානව හිමිකම් ආයතන

1996 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීමට පෙර මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් වරින් වර විවිධ මානව හිමිකම් ආයතන පිහිටුවා ඇත. එකී ආයතන නම් :

### 3.1 විශේෂ සැලකිලි හෝ වෙනස්කම් දැක්වීම තුරන් කිරීමේ සහ මූලික අයිතිවාසිකම් සමීක්ෂණය කිරීමේ කොමිෂන් සභාව

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනත යටතේ සකස් කරන ලද නියෝග වලට අනුකූලව මෙකී කොමිෂන් සභාව සංස්ථාපනය කරන ලදී. එම පනතේ 19 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා පදනම වෙත පැවරුණු බලතල මත එකී පදනම විසින් සකස් කළ නියෝග ජනාධිපතිවරයා විසින් අනුමත කර 1986 ජූලි 24 දින පාර්ලිමේන්තුව ස්ථිර කරනු ලැබීය. මෙකී කොමිෂන් සභාව සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත වන අතර ධූරකාලය වසර 3කි.

මෙම කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ, ජාතිය, ආගම, භාෂාව,කුලය ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය වැනි කරුණු පදනම් කොට රජය, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, රජයට අයත් ව්‍යාපාර ආයතන හෝ කොටස් ප්‍රාග්ධනයෙන් 50% ක් ආණ්ඩුවට අයත් පොදු සමාගම් විසින් කරන විශේෂ සැලකිලි හෝ වෙනස්කම් දැක්වීම් තුරන් කිරීම අරමුණු කරගෙනය. මූලික අයිතිවාසිකම් පිළිපැදීම අධීක්ෂණය කිරීම ද කොමිෂන් සභාවට නියම වී ඇති එක් කාර්යයකි.

විශේෂ සැලකිලි හෝ වෙනස්කම් දැක්වීම් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් අධ්‍යක්ෂවරයා විසින් පරීක්ෂණයක් පවත්වා, සාකච්ඡා පැවැත්වීමෙන්, මැදිහත්වීමෙන් සහ සමථයට පත් කිරීමෙන් එම පැමිණිලිවලට විසඳුමක් ලබාදීමට හෝ එය යථාවත් කිරීමට හෝ ප්‍රයත්නයක් දරනු ලැබේ. එසේ විසඳුමක් ලබාදීමට හෝ එය යථාවත් කිරීමට අධ්‍යක්ෂවරයා අපොහොසත් වන අවස්ථාවක අධ්‍යක්ෂවරයා ඒ පිළිබඳ කොමිෂන් සභාවට වාර්තා කළ යුතුය. කොමිෂන් සභාව ඒ පිළිබඳව මැදිහත් වීමෙන් සහ සමථයකට පත්කිරීම මගින් ගැටළුව නිරාකරණය කරනු ලබයි.

## 3.2 මානව හිමිකම් කාර්ය සාධක බලකාය

1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතේ 19 වන වගන්තිය යටතේ මානව හිමිකම් කාර්ය බලකාය පිහිටුවන ලදී. 1991 ජූලි 31 දින අංක 673/2 දරන ගැසට් පත්‍රය මගින් මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ අත්අඩංගුවේ පසුවන රැඳවියන්ගේ මානව හිමිකම් පිළිබඳ අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීම සඳහා මානව හිමිකම් කාර්ය සාධක බලකාය පිහිටුවනු ලැබීය.

රැඳවුම් ස්ථානවල තත්ත්වය පිළිබඳ පරීක්ෂා කිරීම, රැඳවියන්ගේ සුභසාධනය නංවාලීමට කටයුතු කිරීම සහ රැඳවියන් සම්බන්ධයෙන් ලැබෙන ඕනෑම පැමිණිලක්, තොරතුරුක්, දුක්ගැනවිල්ලක් ලබා ගැනීම හා ඒ සම්බන්ධ අවශ්‍ය ඉක්මන් ප්‍රතිකර්ම ගැනීම මෙම බලකායේ මූලික කාර්යභාරය විය.

## 4.0 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ස්වාධීන කොමිෂන් සභාවකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත මූලික අයිතිවාසිකම් කඩවීමක් හෝ කඩවීමට අත්‍යාසන්න අවස්ථාවකදී විමර්ශනය කිරීම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලබයි. එහි කාර්යයන් ඉටු කිරීම සඳහා එයට පුළුල් බලතල තිබේ.

### 4.1 දර්ශනය

නීතියේ ආධිපත්‍ය කෙරෙහි ඇති ගරුත්වය ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සෑම පුරවැසියෙකුගේම මානව හිමිකම් ආරක්ෂා කිරීම.

### 4.2 මෙහෙවර

ජාත්‍යන්තරව පිළිගෙන ඇති මානව හිමිකම් ප්‍රතිපත්ති වලට අනුකූල වන ලෙසින් මානව හිමිකම් ආරක්ෂා වන ආකාරයෙන් වඩාත් හොඳ මානව හිමිකම් සංස්කෘතියක් බිහිකිරීම සඳහා සියල්ලන්ගේම මානව හිමිකම් සුරක්ෂිත කිරීම සහ වැඩි දියුණු කිරීම උදෙසා ක්‍රියාත්මක වන්නාවූ සියලුම කොටස්කරුවෙන්ගේ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තහවුරු කර ඇති සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත්, ජාතික නිති සහ පිළිවෙත් ජාත්‍යන්තර නීතීන් සහ සම්මුතිවලට අනුකූල වන ලෙස සකස් කිරීමට රජයට මඟ

පෙන්වීමත්, මානව හිමිකම් පිළිබඳ දැනුම දිවයින පුරා ජීවත්වන සියලු පුද්ගලයින් අතර ප්‍රචලිත කිරීමත් වෙයි.

## 4.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලාංඡනය

ලාංඡනයේ නිල් පැහැයෙන් සංකේතවත් වනුයේ මනුෂ්‍ය ස්වභාවයේ සජීවී බව සහ නිර්මාණශීලී බවයි. දෙඅත් වලින් සංකේතවත් වනුයේ ආරක්ෂා කිරීම සහ ඒ සඳහා ක්‍රියාත්මක වීමයි. ලෝක ගෝලය මගින් මානව හිමිකම් විශ්වීය බවත් ජාත්‍යන්තර මට්ටමේ ආරක්ෂාවත් පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවේ සලකුණ මගින් මානව හිමිකම් සඳහා ජාතික මට්ටමේ ආරක්ෂාවක හා ක්‍රියාත්මක වීමක අවශ්‍යතාවය පිළිබිඹු කෙරේ.

## 5.0 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංයුතිය

## 5.1 තෝරා පත් කිරීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය අනුව පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ මත ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාව පත් කර තිබේ. කොමිෂන් සභාව, මානව හිමිකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්දක් ඇත්තාවූ තැනැත්තන් අතුරින් තෝරා ගනු ලබන සාමාජිකයන් සුළු ජාතීන්ගේ නියෝජනය සහිත පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් අයකු සභාපති ලෙස පත් කරනු ලබයි. සාමාජිකයන්ගේ ධූර කාලය අවුරුදු 3කි[1].

## 5.2 කොමිෂන් සභාවේ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම

කොමිෂන් සභාවේ සාමාජිකයෙකු බුන්වත් තැනැත්තකු බවට තීරණය වීම, මෙම ධූරයට අමතරව වැටුප් ලබන වෙනත් සේවයක නිරතවීම, ශාරීරික හා මානසික දුර්වලතා ඇති තැනැත්තකු වීම, සිහිවිකල් බවට තීරණය වීම, චරිත දූෂණ සම්බන්ධයෙන් වරදකරුවීම කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට අනුමැතියකින් තොරව නොපැමිණිම යන හේතූන් උඩ ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. [2]

තවද කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විෂමාචාර හෝ අශක්‍යතාව පදනම් කොට ගෙන නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත

[1] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 3 වන වගන්තිය
[2] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 4 (1)(අ) වගන්තිය

කරන ලද පාර්ලිමේන්තු යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් ධූරයෙන් ඉවත් කළ හැකිය.[3]

කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත්කිරීමේ ක්‍රමවේදය තුලින් මනා කොට පැහැදිළි වන්නේ කොමිෂන් සභා පනත මගින් එහි ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කර ඇති බවයි.

## 6.0 බලතල

1996 අංක 21 දරණ කොමිෂන් සභා පනතේ 11 වගන්තිය මගින් කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් බලතල අතුරින් යම් බලයක් හෝ ඒ බලතල සියල්ලම හෝ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

i. මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් පිළිබඳ විමර්ශනය කිරීම සහ විමසීම් කිරීම
ii. ඕනෑම අධිකරණයක විසඳීමට තිබෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් නඩුවක් සම්බන්ධයෙන්, එම අධිකරණයේ අවසරය ඇතිව, අධිකරණ කටයුතු සඳහා මැදිහත්වීම
iii. රඳවා ගැනීමේ ස්ථාන නිතිපතා පරීක්ෂාකිරීම මගින් රැඳවියන්ගේ සුභසාධනය අධීක්ෂණය කිරීම හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම
iv. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිසම වෙත යොමු කරන ලද ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන්, සමහර විට ශ්‍රේෂාධාධිකරණයේ විධි නියමයන් පරිදි, පියවර ගැනීම
v. මානව හිමිකම් සම්බන්ධ ගැටළු පිළිබඳ පර්යේෂණ සිදු කිරීම භාරගැනීම සහ එවැනි පර්යේෂණවල ප්‍රතිඵල ජනතාව අතර ප්‍රචලිත කිරීම හා බෙදා හැරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
vi. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍යවන සහ සුදුසු වන අනෙකුත් සියළුම කාර්යන් සිදු කිරීම

## 7.0 කාර්යභාරය

1996 අංක 21 දරණ කොමිෂන් සභා පනතේ 10 වගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්යභාරය පහත පරිදි වේ.

---

[3] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 4 (1)(ආ) වගන්තිය

i. සියළුම රාජ්‍ය ක්‍රියා පටිපාටීන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වලට අනුකූල වන බවට තහවුරු කිරීම
ii. මූලික අයිතිවාසිකම්වලට අනුකූලව නීති සම්පාදනය, පරිපාලන විධි නියමයන් සහ ක්‍රියා පටිපාටීන් සකස් කිරීම සඳහා රජයට උපකාරී වීම සහ උපදෙස් දීම
iii. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම පිළිබඳව පැමිණිලි විභාග කිරීම, විමර්ශනය කිරීම සමථය හා සමගි කිරීමෙන් ඒවා විභාග කිරීමට පියවර ගැනීම
iv. ශ්‍රී ලංකාව එළඹ ඇති ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් බැඳීම්වලට අනුකූලව ජාතික නීති සහ පරිපාලන පරිචයන් සකස් කළ හැකි ආකාරය පිළිබඳ රජයට නිර්දේශ ලබාදීම.
v. අන්තර්ජාතික මානව හිමිකම් ගිවිසුම් සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේ ඇති වෙනත් අන්තර්ජාතික මෙවලම් පිළිගැනීම සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම.
vi. රට තුළ මානව හිමිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම

## 8.0 කොමිෂන් සභාවේ ව්‍යුහය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල අනුව එහි කාර්යභාරය සපුරාලීම සඳහා කොමිෂන් සභාව ලේකම්වරයෙකු සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් පත්කරනු ලබයි [4].

කොමිෂන් සභාවේ කාර්යභාරය වඩා කාර්යක්ෂම අයුරින් සපුරාලීම සඳහා ප්‍රධාන කාර්යාලයෙහි අංශයන් 04ක් ද ප්‍රාදේශීය කාර්යාල 10ක් ද පිහිටුවා ඇත. ඊට අමතරව විශේෂ අවශ්‍යතා අනුව සමහර ප්‍රදේශයන්හි ජංගම කාර්යාල ද පිහිටුවා ඇත.

## 8.1 කොමිෂන් සභාවේ අංශයන්

මානව හිමිකම් කොමිෂන් සභාවේ අංශ පහත පරිදි දක්වා ඇත.

1. විමර්ශන සහ පරීක්ෂණ අංශය
2. අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශය
3. අධීක්ෂණ සහ සමාලෝචන අංශය
4. පරිපාලන හා මූල්‍ය අංශය

[4] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 22 වගන්තිය

8.1.1 **විමර්ශන සහ පරීක්ෂණ අංශය**

මෙම අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

- කොමිෂන් සභාවට විධිමත් පැමිණිල්ලක් ගොනු කිරීමට ප්‍රථම ජනතාවගේ පැමිණිලිවලට ඇහුම්කන් දීම, ඒවාට උපදෙස් ලබාදීම
- පුද්ගලික පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම
- කොමිෂන් සභාවේ විසින් එහි මෙහෙයවීමෙන්ම පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යොමු කරන පැමිණිලි සඳහා සහාය දැක්වීම
- විශේෂ විමර්ශන ක්‍රියාත්මක කිරීම
- පොලිස් ස්ථාන, රඳවා තබා ගැනිමේ මධ්‍යස්ථාන, සිරමැදිරි හා රජයේ ගැසට් පත්‍ර මගින් ලියාපදිංචි නිවාස ආදී රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීමත් එම ස්ථානවල තත්ත්වය හා එහි රඳවා සිටින පුද්ගලයින්ගේ රැඳවුම් තත්ත්වය සොයා බැලීමත් හා පවතින ගැටළු වලට පිළියම් නිර්දේශ කිරීම
- අදාළ අධිකාරීන් විසින් එවනු ලබන රඳවා තබා ගැනිමේ නියෝගයන් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා ගැනිම හ නිරීක්ෂණය කිරීම
- කොමිෂන් සභාව හා ජනතාවට ක්ෂණිකව සම්බන්ධ වීමට අවස්ථාව ලබාදීමත් හිංසාවන්, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම පිළිබඳව අදාළ අධිකාරීන් හා සම්බන්ධවෙමින් ක්ෂණිකව ක්‍රියාත්මක වීම

8.1.2 **අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශය**

මෙම අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

- සමාජයේ සිටින අවධානම් කණ්ඩායම් හා ප්‍රතිලාභ අහිමි කණ්ඩායම් වල මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වැඩසටහන් පිළියෙල කිරීම (අභ්‍යන්තර අවතැන්වූවන්, සංක්‍රමණික සේවකයන්, ළමුන් හා කාන්තාවන්, විශේෂ නොහැකියාවන් ගෙන් පෙළෙන කණ්ඩායම් වතු සේවකයන්, වැඩිහිටියන්)

- ඉහත වැඩසටහන් පැවැත්වීම

- අවදානම් කණ්ඩායම් සහ ප්‍රතිලාභ අහිමි කණ්ඩායම් වල සුභසාධනය පිළිබඳ කටයුතු කරන වෙනත් බලධාරීන් සමග සබඳතා ගොඩනැගීම හා පවත්වාගෙන යාම
- ඉහත පුද්ගලයන් පිළිබඳ තත්ත්ව වාර්තා පිළියෙල කිරීම
- තම මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා කඩවීම්වලදී සහන ලබා ගන්නා ආකාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

  එහිදී

  - මහජනතාව දැනුවත් කිරීමේ හා තොරතුරු ලබා ගැනීමේ වැඩසටහන්
  - රාජ්‍ය නොවන සංවිධාන ශක්තිමත් කිරීම
- විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා මානව හිමිකම් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම
- මානව හිමිකම් පිළිබඳ පුහුණු ආකෘති, **අත්පොත්, ලිප ලේඛන හා වෙනත් ලේඛන සකස් කිරීම**

### 8.1.3 **අධීක්ෂණ සහ සමාලෝචන අංශය**

මෙම අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

- දැනට පවතින නීති හා පනවන නව නීතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් වලට හා ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන් හා සම්මතයන්ට අනුකූලද යන්න සොයා බැලීම

- පවතින හා අනාගතයේ පැනවිය හැකි හදිසි නීති රෙගුලාසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් වලට හා ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා සම්මතයන්ට අනුකූලද යන්න සොයා බැලීම

- රාජ්‍ය ආයතන වල පරිපාලන පිළිවෙත් තුලින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීමක් සිදුවේද යන්න පරීක්ෂා කිරීම

- රාජ්‍ය ආයතන මහජනයා හා තම සේවකයන් සම්බන්ධ කටයුතුවලදී මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් සිදු නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පොදු මාර්ගෝපදේශ සකස් කිරීම හා කලින් කලට ඒවා පිළිබඳව සොයා බැලීම.

### 8.1.4 **පරිපාලන හා මූල්‍ය අංශය**

මෙම අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

- කොමිෂන් සභාවේ සියලුම පරිපාලන හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම
- සියලුම මානව සම්පත් කළමණාකරන කටයුතු සිදු කිරීම
- කාර්ය මණ්ඩලයට අවශ්‍ය සියලුම කාර්යාල යටිතල පහසුකම් හා වෙනත් කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා එහි නඩත්තුව
- වාර්ෂික අයවැය සකස් කිරීම

8.2 **ප්‍රාදේශීය කාර්යාල**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය දිවයින පුරා ක්‍රියාත්මක කරවීම පහසුකරවීමේ අරමුණින් සියලුම පළාත් ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල 10ක් පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලයෙන් සිදු කරනු ලබන සියලුම කාර්යන් මෙම ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කරනු ලබයි. මාතර, මහනුවර, අම්පාර, කල්මුණය, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, බදුල්ල, වවුනියාව සහ අනුරාධපුරය යන ප්‍රදේශ වල මෙම ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇත. (1 ආකෘතියෙන් ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇති ස්ථාන පෙන්වා ඇත)

8.3 **ජංගම කාර්යාල**

කිලිනොච්චි, පුත්තලම හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ජංගම කාර්යාල සතියේ නිශ්චිත එක් දිනකදී මහජනතාවට උපදෙස් ලබා දීම සහ පැමිණිලි භාර ගැනීම සඳහා පමණක් දැනට ක්‍රියාත්මක වේ.

කුරුණෑගල, මොනරාගල, රත්නපුර යන දිස්ත්‍රික්කවල ඉදිරියේදී ජංගම කාර්යාල විවෘත කිරීමට නියමිතව ඇත.

9.0 **පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය සහ පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විභාගයක් හෝ විමර්ශනයක් කිරීමේ දී 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 18 වන වගන්තිය යටතේ පහත සඳහන් බලතල පවතී.

- ලබා ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම, භාර ගැනීම
- ප්‍රශ්න කිරීමට අවශ්‍ය සියලුම පුද්ගලයන්ගෙන් සාක්ෂිකරුවන් ලෙස ප්‍රශ්න කිරීම

- දිවුරුම් පිටපතක් හෝ ප්‍රතිඥාවක් පිට යම් සාක්ෂිකරුවෙකුට (ලිඛිත හෝ වාචික) සාක්ෂි ලබා දෙන ලෙස නියම කිරීම
- යම් තැනැත්තෙකු සන්තකයේ ඇති ලේඛන හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම

පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය සහ පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය වගු සටහන් අංක 01 න් දක්වා ඇත.

9.1 **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු වන පැමිණිලි**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය මගින් සුරක්ෂිත මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කළ හැක. ඒ අනුව කොමිෂන් සභාවට යොමුවන පැමිණිලි සමහරක් පහත සඳහන් පරදි වේ.

- වධහිංසාව, කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකීම
- නීතියෙන් පිටත සිදු කරනු ලබන පැහැරගෙන යාම්, පුද්ගල ඝාතන, අතුරුදහන්වීම්
- අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්
- ජාතිය, ආගම, භාෂාව, ස්ත්‍රී/පුරුෂභාවය, දේශපාලන මතය හෝ වෙනත් හේතුමත සිදුවන වෙනස් ලෙස සැලකීම්
- රාජ්‍ය ආයතන වල නොකර හැරීම් (පවතින නිති රීති රාජ්‍ය ආයතන නිලධාරීන් විසින් ක්‍රියාත්මක නොකිරීම්)
- රාජ්‍ය ආයතන වල සේවකයින්ට අදාල ගැටළු
- ළමුන් පාසලට ඇතුලත් කිරීම්
- විනය ක්‍රියමාර්ග හිදී පවතින නීතිය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම
- භාෂණයේ හා රැස්වීමේ නිදහසට අදාල ගැටළු

9.2 **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කල හැකි ආකාරය**

ජනතාවට ඉතාමත් පහසු අකාරයෙන් පැමිණිල්ලක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කොමිෂන් සභා පනත මගින් ඉඩ කඩ සලසා ඇත. එනම් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පාර්ශවයන් විසින් එය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ හැක.

- අගතියට පත් පාර්ශවයට

- කණ්ඩායමකට
- අගතියට පත් පාර්ශවය / කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට
- මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකට මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් අනාවරණය වුවහොත් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් නොවුවද කොමිෂන් සභාව විසින් ස්ව කැමැත්තෙන් එකී කරුණට මැදිහත් වී අවශ්‍ය පියවර ගනු ලබයි[5].

9.3 **පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ දී අදාළ කාරණය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්**

මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකදී වගකිවයුතු පාර්ශවයන් පහත දක්වා ඇත[6].

විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකදී වගකිවයුතු පාර්ශවයන්
- සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
- පළාත් සභා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ලේකම්වරු
- පොලිස් දෙපාර්තමේන්තුව
- ත්‍රිවිධ හමුදා

පරිපාලන ක්‍රියා මගින් වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වගකිවයුතු පාර්ශවයන්
- සියලුම දෙපාර්තමේන්තු
- අධිකාරි
- සංස්ථා
- ව්‍යවස්ථාපිත මණ්ඩල
- ව්‍යවස්ථාපිත කොමිෂන් සභා
- 50% ට වඩා රජයේ කොටස් ඇති සමාගම්

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරන ලද වරදක් සංස්ථානපනය කරන ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් අතෘප්තියට පත් තැනැත්තන්ගේ මූලික අයිතිවාසකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳ චෝදනාවක් විමර්ශන කළ හැක.

---

[5] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 5 වන වගන්තිය

[6] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය

9.4 **පැමිණිල්ලේ අඩංගු විය යුතු තොරතුරු**

පැමිණිල්ලක අවම වශයෙන් පහත සඳහන් තොරතුරු ඇතුලත් විය යුතුය.

- උල්ලංඝනය වී ඇති හිමිකමේ තොරතුරු
- හිමිකම් උල්ලංඝනය වූයේ කෙසේද?
- ඒ සඳහා වගකිවයුත්තේ කවුද?
- හිමිකම් උල්ලංඝනය වී ඇත්තේ කුමන අයුරකින් / කෙදිනද / කොහේද?
- අපේක්ෂිත සහනය

8.5 **විමර්ශනයේ දී ඉදිරිපත් කළ යුතු ලේඛන**

- අගතියට පත් අයගේ සවිස්තරාත්මක ප්‍රකාශයක් / දිවුරුම් ප්‍රකාශ
- සිදුවීමට අදාළ සාක්ෂි ලබා දෙන අයගේ සාක්ෂි ප්‍රකාශ /දිවුරුම් ප්‍රකාශ ලෙස
- පහරදීමකදී නම් එකී පුද්ගලයාගේ අධිකරණ වෛද්‍ය වාර්තා / වෙනත් වෛද්‍ය වාර්තා ලිඛිත හෝ වාචික, වෙනත් තොරතුරු

9.6 **පැමිණිලි කිරීමේ ක්‍රමවේදය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය **භාෂා** ලෙස පිළිගැනෙන සිංහල, **දෙමළ හෝ සන්ධාන භාෂාව වන ඉංග්‍රිසි යන භාෂාත්‍රයෙන් කුමන හෝ භාෂාවකින්** කොමිෂන් සභාව වෙත සම්පූර්ණ විස්තර ඇතුළත් පැමිණිල්ලක් යොමු කළ යුතු අකාරය පහත පරිද වේ.

- මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි භාරගැනීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට බාරදීම මගින් (අදාළ ආකෘති පත්‍රය භාෂාත්‍රයෙන්ම නොමිලයේ නිකුත් කරනු ලබයි)
- ලිපි මගින්
- ෆැක්ස් මගින්
- විද්‍යුත් තැපැල මගින්
- හදිසි ඇමතුම් අංකය මාර්ගයෙන් (වධහිංසා පැමිණිවීම, අත්තනෝමතික සිරභාරයට ගැනීම සහ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් පමණි)

## 9.7 **පැමිණිලි භාර ගැනීම**

එදිනෙදා කාර්යාලයට පැමිණ පැමිණිලිකරුවන්ට අවශ්‍ය මඟපෙන්වීම් හා උපදෙස් ලබා දීමට සතියේ දිනයන්හිදී එක් නිලධාරියෙකු අනුයුක්තව සිටියි. කොමිෂන් සභාවේ විෂය පථය යටතට ගැනෙන පැමිණිලි ලියාපදිංචි කොට අංකයක් ලබා දීම සිදු කරයි.

කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන පැමිණිලි පහතින් දක්වා ඇත.

- මූලික අයිතිවාසිකම් වලට අදාළ නොවන පැමිණිලි
- වෙනත් අධිකරණයක / විනිශ්චය සභාවක විභාග වෙමින් පවතින පැමිණිලි
- කාල සීමාව ඉක්මවූ පැමිණිලි (එය පැමිණිල්ලේ ස්වභාවය අනුව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි)

ඉහත සඳහන් ආකාරයේ පැමිණිලි සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පැමිණිකරුවන්ට දන්වන අතර ඒ සඳහා සහන ලබා ගත හැකි ආයතන වලට යොමුවීමට පැමිණිලිකරුට අවශ්‍ය මගපෙන්වීමට අවශ්‍ය උපදෙස් ලබා දෙනු ලබයි.

පැමිණිලි භාර ගැනීම ප්‍රධාන කාර්යාලය සහ සියලුම ප්‍රාදේශීය කාර්යාල මඟින් සතියේ දිනයන්හිදී සිදු කරනු ලබයි.

## 9.8 **පැමිණිල්ල විභාග කිරීම**

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වේ නම්,

- පැමිණිල්ලට අදාළ වගඋත්තරකරුවන්ගෙන් වාර්තා කැඳවීම සිදු කරයි.
- අදාළ වාර්තාවෙහි පිටපතක් පැමිණිලිකරුගේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කරයි.
- දෙපාර්ශවයේ කරුණු සලකා බලා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමක් හෙළිදරව් වුවහොත් එකී කරුණු සමගි කිරීම හෝ සමථ කිරීම සඳහා පාර්ශවයන් සිතාසි යොමු කර මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කැඳවීම සිදු කරයි[7].

[7] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(2), 20, 16 වගන්ති


- සමථ වීමක් හෝ සමගිවීමක් සිදු වුවහොත් කොමිෂන් සභාව ඒ පිළිබඳව පාර්ශවයන් අදාළ විධාන සිදු කරනු ලබයි [8]
- දෙපාර්ශවයේ කරුණු දැක්වීම අනුව අදාළ පැමිණිල්ල සමගි කිරීම හෝ සමථ කිරීම උචිත නොවන බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක හෝ පාර්ශවයන් සමගි කිරීමට හෝ සමථ කිරීමට එකග නොවන අවස්ථාවක අදාළ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය පිළිබඳව නිර්දේශයක් පාර්ශවයන්ට හා බලධාරීන්ට නිකුත් කරනු ලබයි [9]
- කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන නිර්දේශයන් අදාළ බලධාරීන් විසින් ක්‍රියාත්මක නොකරන අවස්ථාවේදී අදාළ කාරණය සම්බන්ධයෙන් වාර්තාවක් ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන අතර එය ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය[10].

[8] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 16(6) වගන්තිය

[9] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (3)(4) වගන්තිය

[10] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (8) වගන්තිය

**පැමිණිලි කිරීමේ ක්‍රියාපරිපාටිය සහ පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය**



## 10.0 රැඳවියන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මැදිහත්වීම

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 වගන්තියේ (ඈ) අනුව රැඳවියනගේ සුභසාධනය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂ අවධානයක් මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කළ හැකි අතර එමගින් රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුභ සාධනය සහ රැඳවුම් තත්ත්වයන් සුපරීක්ෂණය සිදු කරයි.

### 10.1 රැඳවුම් නියෝග

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ හෝ මහජන ආරක්ෂක ආඥාපනත යටතතේ සිරභාරයට ගන්නා ලද **හෝ** රඳවා ගන්නා ලද හා රැඳවුම් නියෝග මත රඳවා සිටින සැකකරුවන් පිළිබඳ විස්තර පැය 48ක් තුල හා ඔවුන්ගේ රැඳවුම් ස්ථාන මාරු කිරීම් ආදිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දීම හා අදාළ නිලධාරීන්ගේ කාර්යය වේ[11].

මෙම කාර්යය නොකර හරින්නාවූ නිලධාරියෙකුට වරදකරුවකු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පත්වන ලද ලඝු නඩු විභාගයකින් වරදකරු වුවහොත් එක් අවුරුද්දක් නොවැඩි කාලයක් බන්ධනාගත කිරීමකට හෝ රුපියල් 5,000/- නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතුය[12] .

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රැඳවියන්ගේ තොරතුරු රැස්කර ඒ සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

### 10.2 රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 11 (ඈ) වගන්තිය හා 28(2) වගන්තිය ප්‍රකාරව කවර හෝ වේලාවක දී යම් තැනැත්තකු අධිකරණමය ආඥාවකින් හෝ අන්‍යාකාරයකින් රඳවී සිටින පහත සඳහන් ස්ථාන නිරන්තරව අධීක්ෂණය කරනු ලබයි.

- සියලුම පොලිස් ස්ථාන

---

[11] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28 (1) වගන්තිය

[12] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28(3) වගන්තිය

- බන්ධනාගාර
- රැඳවුම් ස්ථාන
- හමුදා රැඳවුම් ස්ථාන
- විළිමහන් සිර කඳවුරු
- පුනරුත්තාපන කඳවුරු
- රජයේ ළමා නිවාස
- මානසික රෝහල්
- වෙනත් රැඳවුම් ස්ථාන / ආයතන

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කරනු ලබන මෙම ස්ථාන පරීක්ෂාවේදී පහත සඳහන් රැඳවුම් තත්ත්වයන් පරීක්ෂා කොට බලා සුදුසු නිර්දේශ අදාළ බලධාරීන් වෙත ලබා දෙනු ලබයි.

- රැඳවියන්ගේ රැඳවුම් තත්ත්වය අවම පහසුකම් යටතේ පවතීද
- නීති විරෝධී රඳවා තබා ගැනීම්
- පහරදීම්, කෲර සහ අවමන් සහගත ලෙස සලකා තිබේ ද
- නිතිඥ සහය ලබා ගැනීමට ඇති ඉඩකඩ
- ඥාතීන්ට / මිතුරන්ට බැලීමට ඉඩකඩ
- රැඳවියන්ගේ සියලුම මානව හිමිකම් තත්ත්වයන් සොයා බැලිම
    - සෞඛ්‍ය හා සනීපාරක්ෂාව
    - ආහාර ඇඳුම්

10.3 **ක්ෂණික දුරකථන පහසුකම**

වධහිංසා පැමිණවීම, අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම හා රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් පැය 24 පුරා ක්‍රියාත්මක ක්ෂණික දුරකථන අංකය **1996** ඔස්සේ මහජනතාවට කොමිෂන් සභාවට දැනුම් දීමට ඉඩ කඩ සලසා ඇත.

## 11.0 **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජය, සිවිල් සංවිධාන සහ ජාත්‍යන්තර ආයතන සමඟ කටයුතු කිරීම**

### 11.1 **රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන**

ශ්‍රී ලංකා රජය විවිධ ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් වලට අත්සන් කොට පිළිගෙන ඇත. එකී ගිවිසුම් හි ඇතුලත් විධිවිධාන අනුව කටයුතු කිරීමට රජයට බැඳීමක් පවතී. රජයක් විසින් රටතුල ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් හා ගිවිසුම්හි අඩංගු කරුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති, පරිපාලනමය වෙනස්කම්, ප්‍රතිපත්ති හා ආයතන පිහිටුවිය හැක. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ වගන්ති 10 (ඉ) අනුව මානව හිමිකම් ක්ෂේත්‍රයේ දී ගිවිසුම්වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායක වීමේ හා එකඟවීමේ අවශ්‍යතාවය පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම කළ හැක.

තවද 10 (ඈ) අනුව ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම් වල නියමයන් හා සම්මතයන්ට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පවතී.

මානව හිමිකම් කොමිෂන් සභාව රටතුල පවතින විවිධ මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් තොරතුරු රැස්කර අදාල රජයේ ආයතනයන් සමග සාකච්ඡා කර එම ගැටළු නිරාකරණය කර ගැනීම අවශ්‍ය මාර්ගෝපදේශ, උපදෙස් සහ නිර්දේශ ලබා දීමට කටයුතු කරයි.

ඊට අමතරව රජය මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තරයට වාර්තා සකස් කිරීමේ දී උපදේශනය සහ දායකත්වය ලබාදෙයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (ඇ) අනුව මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලන විධිවිධාන සහ කාර්ය පටිපාටි සකස් කිරීමට ආණ්ඩුවට උපදෙස් දීම සහ සහය වීමේ හැකියාව කොමිෂන් සභාවට පවතී.

### 11.2 **සිවිල් සංවිධාන**

සිවිල් සංවිධාන ද මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පුළුල් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. පැරිස් ප්‍රතිපත්තිහි සඳහන් පරිදි ජාතික මානව හිමිකම් ආයතන රාජ්‍ය නොවන සංවිධාන සමග මානව හිමිකම් සුරැකීමේදී සමබන්ධතාවයක් පවත්වාගෙන යා යුතුය. ඒ අනුව ශ්‍රී

ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද සිවිල් සංවිධාන සමඟ සහයෝගයෙන් හා මනා සම්බන්ධීකරණයකින් යුක්තව මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා එක්ව කටයුතු කරයි. රජය සහ සිවිල් සංවිධාන අතර සම්බන්ධීකරණය සිදු කිරීමේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

## 11.3 **ජාත්‍යන්තර සංවිධාන**

ජාත්‍යන්තර ප්‍රඥප්තීන් හා සම්මුතීන් වලට අදාළව එක් එක් කමිටු සඳහා ස්වාධීන වාර්තා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

උදා: විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාවට අදාලව කොමිෂන් සභාවේ විසින් යොමු කළ ස්වාධීන වාර්තාව

ජාත්‍යන්තර ආයතන සමඟ පවතින සහයෝගය හේතුවෙන් විශේෂඥ දැනුම, තාක්ෂණික සහයෝගීතාවය, මූල්‍ය ආධාර මෙන්ම පවතින පොදු ගැටළු සම්බන්ධව තොරතුරු සහ දැනුම හුවමාරු කර ගැනීමේ හැකියාව පවතී.

### 11.3.1 ආසියානු පැසිපික් සංසදය

ආසියානු පැසිපික් කලාපයේ මානව හිමිකම් පිළිබඳ ප්‍රධානතම සංවිධානය ආසියානු පැසිපික් සංසදය වේ. 1996 ස්ථාපිත කළ මෙය කලාපයන්තුල ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන පිහිටුවීම හා බලගැන්වීම සඳහා කටයුතු සිදු කරයි.

එහිදී සාමාජික රටවලට,

- එකී රටවල මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමට සහයෝගය ලබා දීම
- ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ස්වාධීන ජාතික මානව හිමිකම් ආයතන පිහිටුවීමය රජයන්ට හා සිවිල් සංවිධානවලට සහය ලබා දීම
- කලාප මට්ටමින් හා ජාත්‍යන්තරව මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

ආදිය සිදු කරයි.

## 12.0 **කොමිෂන් සභාවේ වගවීම**

කොමිෂන් සභව විසින් සිය කාර්යභාරය ඉටු කිරීම සඳහා කරන ලද ක්‍රියා කාරකම් සියල්ල රටේ පාර්ලිමේන්තුවට සහ ජනතාවට දැන ගැනීමට සැලැස්වීම එහි වගකීම වේ. ඒ අනුව කොමිෂන් සභාව සෑම වසරකම පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කරනු ලැබේ[13].

කොමිෂන් සභාව විසින් පවත්වන ලද මානව හිමිකම් පිළිබඳව පර්යේෂණ සම්බන්ධ වාර්තා, විවිධ මානව හිමිකම් කාරණා සම්බන්ධයෙන් සකස් කරන ලද නිර්දේශ සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වූ පොත්පත් මහජනතාවට ඉතා පහසුවෙන් පරිශීලය කිරීමට සඳහා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත.

කොමිෂන් සභාව පිළිබඳව සහ මානව හිමිකම් සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු අධ්‍යයනය කිරීමට මහජනතාවට පරිශීලනය කිරීමට නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය (www.hrcls.lk) භාෂාත්‍රයෙන්ම ආරම්භ කර ඇත.

## 13.0 **කොමිෂන් සභාවට අපහාස කිරීම**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි පහත දක්වා ඇති ක්‍රියා සිදු කළහොත් ඒ වැරදි ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරියට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද වැරදි ලෙස සලකනු ලැබේ[14].

1. කොමිෂන් සභාවේ අධිකාරියට අපහාස කිරීම
2. කොමිෂන් සභාවේ අධිකාරියට කුමන ආකාරයෙන් හෝ සිදු කරන ලද අපහාස කිරීම
3. සිතාසියක සඳහන් පරිදි කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීම සාධාරණ වන හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබීම
4. දිවුරුම් හෝ ප්‍රතිඥාදීම, ප්‍රතික්ෂේප කරනු ලැබීම හා ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම

[13] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වගන්තිය

[14] 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 වගන්තිය

5. කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන විධානයන් සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබීම
6. කොමිෂන් සභාවේ මතය අනුව විමර්ශනයන් සඳහා අදාළ වන ලියකියවිලි සාධාරණ වන හේතුවක් නොමැතිව ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ප්‍රතික්ෂේප කරනු ලැබීම

14.0 කොමිෂන් සභා නිලධාරීන්ට ඇති විශේෂ මුක්ත**වීම්** /ආරක්ෂණ

කොමිෂන් සභා නිලධාරියකු හෝ සේවකයකු සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් පිළිබඳ සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකිය.[15]

කොමිෂන් සභාවට ලැබෙන ලියවිල්ලක් **හෝ කොමිෂන් සභා පනත යටතේ සපයන වාර්තාවක් සම්බන්ධයෙන් ද සිවිල් හා අපරාධ නඩුවක් කොමිෂන් සභාව නිලධාරියකුට, සේවකයකුට සාමාජිකයකුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට විරුද්ධව පැවරිය නොහැකිය.**[16]

## 14.0 නිගමනය

රටතුල මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉතා පුළුල් කාර්යභාරයක් ඉටුකරමින් සිටින ඉතාමත් වැදගත් ආයතනයක් වන අතර දිවයින තුල මානව හිමිකම් සංස්කෘතියකට ගරු කරන සමාජයක් බිහිකිරීම වෙනුවෙන් වඩාත් ඵලදායී සේවයක් ඉදිරියටත් සිදු කරනු ඇත.

[15] 1996 අංක 21 දරන මානව **හිමිකම් කොමිෂන් සභා** පනතේ 26 (1) වගන්තිය

[16] 1996 අංක 21 දරන මානව **හිමිකම් කොමිෂන් සභා** පනතේ 26 (2) (3)වගන්තිය

**ඇමුණුම් I**

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ සම්බන්ධ විය හැකි ආකාරයන්

### (අ) ප්‍රධාන කාර්යාලය

| | | |
|---|---|---|
| **ලිපිනය** | : | නො.165, කින්සි පාර, කොළඹ 08 |
| **දුරකථන** | : | 011-2694925, 2685980, 2685981 |
| **ක්ෂණික ඇමතුම්** | : | 1996 |
| **විද්‍යුත් තැපෑල** | : | 011-2694924 |
| **ඊමේල්** | : | **sechrc@sltnet.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.hrcsl.lk** |

| | | |
|---|---|---|
| සභාපති | : | 011 2696470 |
| ලේකම් | : | 011 2689558 |
| නීති ලේකම් | : | 011 2689558 |
| අධ්‍යක්ෂ - පරීක්ෂණ සහ විමර්ශන | : | 011 2674200 |
| අධ්‍යක්ෂ - අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් | : | 011 2686282 |
| අධ්‍යක්ෂ - අධීක්ෂණ සහ සමාලෝචන | : | 011 2673806 |
| අධ්‍යක්ෂ - පරිපාලන සහ මූල්‍ය | : | 011 2662098 |

(ආ) **ප්‍රාදේශීය කාර්යාල**

| ප්‍රාදේශීය කාර්යාල | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| මහනුවර | **8/1, ප්‍රිම්රෝස් වීදිය, පේරාදෙනිය පාර, මහනුවර** | 081 – 2228009 |
| මාතර | **15, කාලිදාස පාර, මාතර** | 041 – 2226533<br>ෆැක්ස් 041-2223307 |
| මඩකලපුව | **24, සින්නඋප්පොඩේ පාර, මඩකලපුව** | 065 – 2224420 |
| අනුරාධපුරය | **623/20 ඊ, ෆ්‍රීමන් පාර, අනුරාධපුරය** | 025 – 2234801 |
| ත්‍රිකුණාමලය | **227, ප්‍රධාන වීදිය, ත්‍රිකුණාමලය** | 026 – 2222607 |
| වවුනියාව | **26/2, පිටරවුම් පාර, වවුනියාව** | 024 – 2222029 |
| බදුල්ල | **19/1 බී, බදුලුපිටිය පාර, බදුල්ල** | 055 – 2223030 |
| අම්පාර | **ඩී 768/1, පණ්ඩුකාභය මාවය, අම්පාර** | 063 - 2222340 |
| කල්මුනය | **නො. 161/1, ප්‍රධාන වීදිය, කල්මුණය** | 067 – 2229728 |
| යාපනය | **නො. 1, 3 වන හරස් වීදිය, යාපනය** | 021 – 2222021 |